(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 142.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 ජනවාරි මස 26 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **අනුර සිඩ්නි ජයරත්න මහතා**

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

**ගරු ඉෂාක් රහුමාන් මහතා**

**ගරු මුජිබුර් රහුමාන් මහතා**

**ගරු වමල් රාජපක්ෂ මහතා**

**ගරු අංගජන් රාමනාදන් මහතා**

**ගරු ගාමිණී ලොකුගේ මහතා**

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2011 සහ 2012 වර්ෂ සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා සෞඛ්‍යය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චමල් රාජපක්ෂ මහතා වෙනුවෙන් එහි සාමාජික ගරු එම්. එච්. එම් සල්මාන් මහතා විසින්, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "මෝටර් වාහන පනත (203 අධිකාරිය) යටතේ නියෝග", "2013 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව" සහ "2012, 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තා" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ලකී ජයවර්ධන මහතා වෙනුවෙන් එහි සාමාජික ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින්, සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "දිවිනැගුම (සංශෝධන) පනත් කෙටුම්පත" සම්බන්ධයෙන්වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. පෙත්සම් :**

(1) කුරුවිට, කුරුවිට බන්ධනාගාරයේ සේවය කරන ආර්. වයි. කේ. ප්‍රියන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2016.10.24 දිනැති පෙත්සම ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කළුතර, නාගොඩ, මතුගම පාර, අංක 395 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. නීටා මහත්මියගෙන් ලැබුණු 2016.09.18 දිනැති පෙත්සම ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ඌරගස්මන්හන්දිය, කයිලන්ත, "සැල සෙවන" යන ලිපිනයෙහි පදිංචි බුද්ධික සම්පත් ජයතිලක මහතාගෙන් ලැබුණු 2016.10.25 දිනැති පෙත්සම ගරු මනූෂ නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ජා-ඇල, උතුරු බටගම, ඇවරියවත්ත පාර, අංක 360/එල් දරන ස්ථානයෙහි පදිංචි ආර්. බන්දුල මහතාගෙන් ලැබුණු 2016.11.07 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. වරප්‍රසාද :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2016 දෙසැම්බර් මස 07 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, අංක 127 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, විවාද විය.

(අ. භා. 12.05 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.07 ට ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.19 ට ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 5 වන පේළියේ සිට 7 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-"

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 2 වැනි පිටුවේ 1 වන පේළියේ සිට 8 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි නව වගන්තිය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 4 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" 105 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය, එම වගන්තියේ 5(ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''(5ඇ) 43අ වගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා ස්වකීය හිමිකම සනාථ කරන සෑම තැනැත්තෙකුගේම නම රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසු 43 වන වගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් එම තැනැත්තා ලියාපදිංචි කරනු ලැබුයේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් එම තැනැත්තාගේ නම දන්ත වෛද්‍යවරුන් වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී ඇති තැනැත්තන්ගේ නම් ඇතුළත් ඉහත සඳහන් ලේඛනයේ එම කොටසින් ඉවත් කරනු ලැබිය යුතු ය''.

වගන්තිය දෙවැනි වර කියවිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

''ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය''යි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**6. කල් තැබීම (පොල් සංවර්ධන අධිකාරිය පවරාගත් කරන්දායි ග්‍රාමයේ ඉඩම්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.30 ට, 2017 ජනවාරි 09 වැනි දින සභා සම්මතිය අනුව, 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා පූ. භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.